# කුරුසයේ පාදනමස්කාරය



(දයාධික මනස්තාපය සහ සුරණපරා පර... යනාදිය කියන්න.)

ආරම්භක ගීතිකාව

පවුබර අපගේ ගස කර පටවා
සව්මවු මුවසිරි රුවකිසි නැතුවා
දෙව් නදනා යති නෙක දුක් විදවා
තැව්ලැති සිත්ගෙන යමු ඒ පසුවා

ජේසුස් විදිනා මේ වතුද ගැහැටු
ලෝවැස්සෙව් පින් රාශිය සතුටු
මානුස් අප පව් සෝදනු කිලුටු
මේ ලෙසේ අයදිමු අප සැම පවිටු

# පළමුවෙනි ස්ථානය

## ජේසුස් ස්වාමිදරුවෝ මරණයට තීන්දුව ලබන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, මාගේ පව්වලින් ගණන් නැති වාරයක් මා විසින් ස්ථිර කළ මේ අනඩු තීන්දුව බලා, මට ලැබෙන්නට තිබෙන සදාකාල මරණයේ තීන්දුවෙන් මා ගලවා වදාරණවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්


දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# දෙවන ස්ථානය

## දුශ්ඨ ජුදයෝ ජේසුස් ස්වාමිදරුවන්ගේ ශ්‍රී කරපිට කුරුසය තබති.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි, මාගේ පවුවලින් තනන ලද බරවු කුරුසිය ඔබවහන්සේ සතුටින් කරට ගත් සේක් වේද? මගේ පව්වල නපුරුකම හැදින මගේ ජීවිතය තිබෙන තුරු ඒවා නිසා නෙත් කදුලු හැර අඩා වැලපෙන්නට මට කරුණා කරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවු අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවු ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කනයා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# තුන්වන ස්ථානය

ජේසුස් ස්වාමිදරුවෝ කුරුසේ බරෙන් පළමු
වෙනි වර බිම වැටෙන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි, මාගේ පව් බර ඔබ වහන්සේව බිම හෙලුවා වේද? මාගේ එවැනි පාපවල් සම්පූර්ණයෙන් ම ත්‍යාජ කරමි. ඒවාට ඔබවහන්සේගෙන් ක්ෂමාව ලැබේන මෙන් නිතරම ආරාධනා කරමි. මතු කවර කලෙකවත් පාපයක් නොකරන්ට මාගේ ස්වාමිනි.මට ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# සතරවන ස්ථානය

## ජේසුස් ස්වාමිදරුවන්ට උන්වහන්සේගේ පිරිසිදු මෑණියෝ සම්මුක වන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි,දුක් ශෝකයෙන් පිරී සිටින පිරිසිදු මෑණියනි, ඔබවහන්සේලාගේ දුක් ගාවිනාවලට හේතුව මාගේ ගණන් නැති පව් වන්නේ වේද? මාගේ ජීවිතයේ ඉතුරු කාලය ඇතුළතදී පාපයක් නොකරන්ට මාගේ ජේසුනි, ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය ලැබුන මැනව. පිරිසිදු මාතාවෙනි, ඔබවහන්සේට සහ ඔබ ප්‍රේමවන්ත කුමාරයාට මරණය දක්වා විශ්වාස පක්ශ ලෙස ආදරේ වෙන්ට මට දේව උපකාරය ලැබෙන පිණිස මා නිසා යාච්ඤා කර වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# පස්වන ස්ථානය

## කුරුසිය ගෙන යන පිණිස සීමොන් සිරනේවුස් ජේසුස් ස්වාමි දරුවන්ට උදව්වෙයි.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, කුරුසිය ගෙන යන්නට උදව්වන සීමොන් සිරනේවුස් භාග්‍යලද්දාහුමය. මට ඔබවහන්සේ කලින් කලට දෙවාවදාරණ කුරුසිය මමත් ඉවසිල්ලෙන් දරමින් ඔබගේ කුරුසිය ගෙනයන්නට ඔබට උදව් වෙන්නෙම් නම් මමත් භාග්‍යලද්දා වන්නෙමි. මාගේ ජේසුනි, එසේ කරනට මට ඔබගේ ප්‍රසාද උපකාර දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# හයවන ස්ථානය

### වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රී ජේසුස් ස්වාමිදරුවන්ගේ ශ්‍රී මුහුණු මණ්ඩලය පිස දමයි.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, ඔබවහන්සේ වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රී ඔබගේ ශ්‍රී මුහුණ පිසදැමූ පිස්නාකඩයෙහි ඔබගේ ශ්‍රී ශුද්ධ මුහුණ මණ්ඩලයෙහි රූපය පදිංචිකර වදාරන්නට කරුණා අභිප්‍රාය වූ සේක් වේද? ඔබගේ දුක්ගාවිනා මාගේ ආත්මය තුළ ස්ථිර ලෙස පදිංචිකර වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# හත්වන ස්ථානය

## ජේසුස් ස්වාමිදරුවෝ කුරුසේ බරින් දෙවෙනිවර බිම වැටෙන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි, මා නැවත් නැවතත් කළ අධර්මිෂ්ඨකම් ඔබවහන්සේව නැවතත් බිම හෙලුවා වේද? පාප අපරාධවලට ඇද නොවැටෙන්නට ස්වාමිනි ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# අටවන ස්ථානය

## ජේසුස් ස්වාමි දරුවෝ ජෙරුසලමේ ස්ත්‍රීන් සනසා වදාරන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, ඔබවහන්සේ විදින දුක් දැක ඔබ පස්සේ හඬා වැලපෙමින් ගිය ස්ත්‍රීන් ඔබ සැනසූ සේක් වේද? ඔබවහන්සේගේ දයාබර කමින් මාගේ ආත්මයත් සනසා වදාල මැනව. ඔබවහන්සේගේ දයාබරකම කෙරෙහි පමණක් විශ්වාස ඇතුව සිටින්නටත් ඊට අනුකූලව ක්‍රියා කරන්නටත් ස්වාමිනි ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්


දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# නමවන ස්ථානය

## ජේසුස් ස්වාමිදරුවෝ කුරුසේ බරින් තුන්වන වර බිම වැටෙන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, අයියෝ මාගේ පව්වල කෲරකමක සැටි. ඔබවහන්සේව තවත් වරක් බිම හෙලුවාවේද? මෙවැනි නපුරු පාප නැවත කරනවාට වඩා මාගේ ප්‍රාණය ඔබට පුදකරන්නට ධෛර්යය මට ලැබෙන පිණිස ස්වාමිනි, ඔබවහන්සේගේ ප්‍රසාද උපකාර දේවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.


**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# දසවන ස්ථානය



### දුශ්ඨ ජුදයෝ ජේසුස් ස්වාමි දරුවන්ගේ වස්ත්‍ර කඩා දමති.

**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි, මයහීඳවයේ ආදර්ශය වු ඔබ මා නිසා නිර්වස්ත්‍රව වැඩ ඉන්නා සේක් වේද? ලෝක ආසා සියල්ලම ඉවත ලා යක්ශයත්, ලෝකයත්, මාංශයත් ත්‍යාජකරන්ට ස්වාමිනි, ඔබවහන්සේගේ ප්‍රසාද උපකාර මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.


**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# එකළොස්වන ස්ථානය



## ජේසුස් ස්වාමිදරුවෝ කුරුසයේ අණගසනු ලබන සේක.

**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, ඔබවහන්සේගේ ශ්‍රී අත් පා කුරුසියේ ඇණගසනු ලබන්ට ඔබවහන්සේ කරුණා අභිප්‍රාය වූ සේක් වේද? මෙසේ ඔබවහන්සේ මා නිසා විදින වේදනා බලා මාගේ මාංශයත් සැබෑ ක්‍රිස්තියානි ලීලාවෙන් පශ්චාත්තාප ක්‍රියාවලින් ඇණ ගසන්ට ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.


**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# දොළොස්වන ස්ථානය



## ජේසුස් ස්වාමිදරුවෝ කුරුසියෙහි උකුත්වන සේක.

**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වු ජේසුනි, තුන් පැයක් කුරුසේ එල්ලී ඉද වේදනා වින්ද ඉක්බිති ඔබවහන්සේගේ ආශිර්වාදය ලත් ප්‍රාණය මා නිසා පුදකළ සේක් වේද? ඔබවහන්සේට ද්‍රෝහිකමක් කරනවාට වඩා මාගේ ප්‍රාණය දෙන්ටත් , ජීවිත් ව සිටින තුරු ඔබවහන්සේට පමණක් විශ්වාස පක්ශ ලෙස ආදරේ වෙන්ටත් ඔබ වහන්සේගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# දසතුන්වන ස්ථානය



**ජේසුස් ස්වාමිදරුවෝ කුරුසියෙන් බානලදුව තමන් වහන්සේගේ පිරිසිදු මෑණියන්ගේ උකුලෙහි පුනවනු ලබන සේක.**

**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

වික්ශෝපයෙන් පිරී වැඩසිටින පිරිසිදු මෑණියනි, ඔබවහන්සේගේ ඇස් ඉදිරියේ දී ම ඔබගේ ප්‍රේමවන්ත කුමාරයාගේ ප්‍රාණය තුරන්වෙනවා දැක වික්ශෝප කඩුවෙන් ඔබගේ හෘදමණ්ඩලය සිදුරුවුනා වේද? ඔබගේ ශ්‍රී කුමාරයාගේ වික්ශෝපයටත් කාරණා වූ මාගේ පව් නිරතුරුව ම තුච්චකරන්ටත්, මාගේ ජීවිතය තිබෙන තුරු සැබෑවූ ක්‍රිස්තියානි කාරයෙකු මෙන් ජීවිතය පසුකරන්නටත් මට දේව වරප්‍රසාද උපකාරය ලැබෙන පිණිස පිරිසිදු මෑණියනි , මා නිසා යච්කදා කළ මැනව.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්


දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව

# දසසතරවන ස්ථානය

## ජේසුස් ස්වාමිදරුවෝ ගල්ලෙනෙහි තැන්පත් කරනු ලබන සේක.



**පදය** - ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.

**උත්තරය** - මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන් ඔබවහන්සේ ලෝකය ගලවා ගත් සේක.

මාගේ අමෘතබර වූ ජේසුනි, ඔබවහන්සේ හා සමග මළා වූ කෙනෙක් මෙන් නිතරම පවතින්ට මම ආශාවෙන් සිටිමි. මම ජීවත් ව ජීවිතයෙන් පසු මෝක්ශයේ දී ඔබවහන්සේගේ අශීර්වාදය ලත් දුක්ගාවිනාවල හා මරණයේ ඵල භුක්ති විදින්නට පිලිවන් වන පිණිස ඔබවහන්සේගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාරනවා සොදේ.

පර.1 නමෝ.1 ත්‍රිත්.1 කියනු

**පදය** - ස්වාමිනි, පාපීවූ අපට කරුණාකර වදාළ මැනව.

**උත්තරය** - අපට කරුණා කළ මැනව.

**පදය** - මළාවූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා.

**උත්තරය** - ආමෙන්

දේව කන්‍යා නිමල මවු නේ

ඔබගේ කුමරා දැරුව වණවල්

මා හදයේ සන් කළ මැනව